# ළමා අපචාර හා ශ්‍රී ලාංකික දේශපාලනය




යුද්ධයෙන් වැසී තිබූ අප රටේ අපරාධ රැල්ල නැවත මතු වී උඩු කරණම් ගසන තත්වයක පත්ව ඇත. යුධ පුවත්වලට ප්‍රධාන තැනක් ලබා දී තිබූ මාධ්‍යවලට අද රස කරමින් තළු මරමින් හඬ නගා කිව හැකි අපරාධ රැල්ල සමග ශ්‍රී ලංකාවේ දේශපාලනය ඇත්තේ කොතැනද බව සැඟවිය හැකි රහසක් නොවේ. එදා බෝම්බයක් පිපුරුණු විට මළ ගණන පිළිබඳව මුලින්ම ඇසූ රටේ ජනයා මේ අපරාධ රැල්ල සමඟ තුෂ්නිම්භූත වී ඇත්තේ "බෝම්බයටද අනුකම්පාවක් ඇත." යන සිතිවිල්ල සිත තුළ තද කරගනිමිනි. එදා යුද්ධය මුවාවෙන් රජයේ කුලී හමුදාද මිනීමැරුවෝය. ත්‍රස්තවාදී සංවිධාන ද මිනී මැරුවෝය. එදා මළ මිනිසාට වඩා වධකයාට හොඳ වටිනාකමක් ඇතිවූ කාලයකි. ද්‍රෝහියන් වීරයන් වෙන්නේ හඳුනාගත් ජනතාව වීරයාට මල් පිදුවෝය. ද්‍රෝහියාට ගල් ගැසුවෝය.



ලක්ෂ්මන් කොඩිතුවක්කු

ඒ වීරයන් අතරින්ද දේශපාලන වීරයා මතුවී ජනතාවගේ නම්බුනාම ලබන තත්වයට පත්වූයේය.

මෑතකදී ආර්ථික ප්‍රශ්න හමුවේ දෙමව්පියන් අතහැරදා රැකියාවක් සොයා පැමිණි දහහතර හැවිරිදි දියණියක් කෙලසීමට ප්‍රාදේශීය සභා සභාපතිවරයකු ද සම්බන්ධ වූ පුවත මව්බිම තුළ ජීවත්වන කාගේ වුවද ඇසට කඳුලක් නැගුණු සිද්ධියක් විය. කෝටිපති ව්‍යාපාරිකයන් හා ඔවුන්ගේ මිතුරන් අතරේ හුවමාරු වී වරින් වර දූෂණයට ලක්වූ දැරියන්ගේ අනාගතය පිළිබඳව ඉතිරිව ඇත්තේ කඳුල පමණකි. ළමා ප්‍රඥප්තීන් අකුරට ඉටු කරන බව කියන රටක, දුප්පත්කම නිසා තම ශරීර කූඩුව මුදලාලිට බිලිදීමට සිදුවේ නම් එම ප්‍රඥප්තියෙන් ඇති ඵලය කිම ? එසේම මෑතකදී කෝටිපති ව්‍යාපාරිකයකුගේ පුතකු විසින් පැහැරගෙන ගොස් අතවර කරන ලද පහළොස් හැවිරිදි දැරියක නාවලපිටිය නගරයේ අතහැර දමා ගොස් සිටියදී ඇයගේ ආරක්ෂාවට සිටින උත්තරීතර පොලිසියේම පොලිස් නිලධාරියකු හා ඔහුගේ මිතුරෙකු අ....... නැවතත් දූෂණය වීම බෞද්ධ ධර්මය රජයන ලාංකික මිහිකතට කෙසේ ඉවසිය හැකිද ?

අද දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුව දක්වා ළමා අපචාර ඉහළ ගොස් ඇති අයුරු දකිනවිට අවුරුදු දෙදහස් පන්සීයක ඉතිහාසයක් ගැන පුන පුනා උදම් අනන ශ්‍රේෂ්ඨ ශිෂ්ඨාචාරයක් ගැන නන් දොඩන ජාතියක් ගැන ආඩම්බර විය හැක්කේ කෙළෙසකද ? මත් කුඩුවලින් නන්නත්තාර වූ ඥාති සහෝදරයා අතින් මිලින වූ සය හැවිරිදි සිඟිති දැරිය දූෂණය කර කුණු ඇළකට දමා වනසා දැමීමට තරම් අමන වූ තිරිසනුන් සිටින රටක නියම තිරිසනා උන්ඩ වඩා කෙතරම් උසස්දැයි දැනෙන්නේ මෙවැනි වකවානුවක නොවේද ?. අද බාප්පලා තාත්තලා මහප්පලා අතින් තම දැරියන් දූෂණය වෙති. උදේ සිට රාත්‍රිය දක්වා බණ දේශනා කරන රටක මෙවැනි අපරාද ධර්මයෙන්ම පමණක් වැළැක්විය හැකිද ? සුදු රෙද්දෙන් ඔළුව වසාගෙන හඳුනාගැනීමේ පෙරට්ටුවලට යන මෙවැනි චරිත ජනතාව හොඳින් හඳුනති. දනිති. එහෙත් ඒ සියල්ලන්ගෙන්ම බේරී ඔවුන් නැවත ජනතා පුත්‍රයන් බවට පත්වෙති.

අද රටේ ප්‍රධාන දේශපාලන නායකයන් පවසන්නේ ස්ත්‍රී දූෂණය අද ඊයේ පැවති එකක් නොවන බවය. එය ඈත අතීතයේ සිටම පැවත එන අපරාධයක් බවය. අද ආණ්ඩු පක්ෂ විරුද්ධ පක්ෂ භේදයකින් තොරව මේ දෙපසේම ප්‍රාදේශීය දේශපාලඥයන් ස්ත්‍රී දූෂණවලට චෝදනා ලබා ඇත. එදා කතරගම රූමතිය දූෂණය කර මරා දැමූ හැටි කියද්දී කඳුළු සැලූ ජනතාව, අද එවැනි දෑ දහස් ගණන් සිදු වෙද්දිත් නිහඬව දරාගෙන සිටීම කෙතරම් පුදුමසහගතදැයි සිතා ගැනීමටවත් නොහැකි කාරණාවකි.

රජයේම සිටින තිස්ස කරලියද්ද ඇමතිවරයා ළමා අපචාරවලට දැඩි දඬුවම් ලබාදෙන නීති ක්‍රියාත්මක කරන බව මෑතකදී පැවසුවේ බොහෝ උජාරුවෙනි. ඔහු එහිදී නවීන තාක්ෂණයට දොස් නඟයි. පරිගනක හා වෙබ් අඩවි පිළිබඳව දෝෂාරෝපනයෙන් කතා කරයි. රූපවාහිනී වැඩ සටහන්වල ඇති අපරාද දර්ශන ගැන පවසයි. එහෙත් මේවාට සම්බන්ධ දේශපාලකයන් ගැන ඔහු කතා නොකරන්නේ ඇයි. අද අප රටේ බොහෝ අපරාද පිටුපස ඇත්තේ දේශපාලනය බව ඔහු නොදන්නේද ? සල්ලාලයන්, අධමයන් පිරිවරාගෙන මනාපයට පොරකන දේශපාලකයන් බලයට පැමිණි විට ඔවුන්ට දොළ පිදේනි දීමට සිදුවන බව රහසක් නොවේ. දොළ පිදේනි පිටුපස හඹායන අධමයන් වෙනුවෙන් බලය ලබාගත් නායකයන්ට සිදුවන්නේ "නිහඬ කම" දරා ගැනීම පමණකි. ඔවුන් ඒවා නිහඬව අනුමත කරන්නේ "බලය" නැමැති සාධකයට නව අරුතක් ලබා දෙමිනි.

මිනීමරු දේශපාලුවන් මාංචු දමාගෙන




සභා රැස්වීම්වලට පැමිණෙද්දී ඔවුන්ට ආරක්ෂාව ලබා දීමට රජයේම ආරක්ෂා හමුදා ලබාදී ඇති යුගයකට රට තල්ලු කර ඇත්තේ කවුරුන්ද යන වග ඇසිය යුත්තේ එවැනි ඇමතිවරුන්ගෙන්මය.

පාරවල් කාපට් කළත්, මීටර් සිය ගණන් උසට බුදු පිළිම ඉදි කළත්, අහස උසට කුළුණු නිර්මාණය කළත්, පාන් කෑල්ලෙන් කහට කෝප්පයෙන් කුස පුරවාගෙන ඩීසල් දුම් පිඹිමින් ගාටන අබලන් බස් රථවල එල්ලී ගාටන ජනයාට පෙනෙන්නට නෙළුම් පොකුණ හැදුවත්, රටක සංවර්ධනය යනු එයද ? නැත. තවමත් යුධ ජයග්‍රහණයෙන් උදම් අනන නායකයන්ට වැරදුණු තැන් බොහෝමයක් ඇත. ඔවුන් ඒවා නිවැරදි කරගැන්මට උත්සහ දරණ පාටක්ද පෙනෙන්නට නැත. අද ආගම, කලාව, දේශපාලනය යන සියල්ලන්ටම "මුදල" නැමැති සාධකය මුල් වී ඇත. එවැනි රටක ගෞතම බුදුවරුන් බිහිවේ රජවරුන් බිහිවේ.

කලාකරුවන් දේශපාලකයන් අසළ වැඳ වැටෙන්නේ බඩ වියත රැකගැනීමටය. මෑතකදී කටුම්බා ආරණ්‍යයට ගිය මා හට එහි නායක ස්වාමීන් වහන්සේ ලංකාවේදී සිදු වූ පුවතක් පැවසුවේ පුදුම සහගතවය. උන් වහන්සේ ලංකාවේදී සහභාගී වූ පින්කමදී එහි පැමිණි ශ්‍රාවකයන-"ට පින්කම අවසානයේ පිරිත් ගැටගසා ඇත. එහෙත් එක් ශ්‍රාවකයකු අතේ දැවටී ඇති තවත් පිරිත් නූල් දෙස උන්වහන්සේ නෙත් හෙළු මොහොතේ ඔහු පවසා ඇත්තේ එම පිරිත් නූල ඉතා බලගතු එකක් බවත් ඔහු එය වටිනා මුදලකට මිලට ගත් බවත්ය. අද පිරිත් නූලටද වෙළඳපොළක් ඇති වී ගෙන යන කාලයකි. අද කලට වැසි වැස්සත් රජ දැහැමිය. නොවැස්සත්

A.T. PARTNERS
Accountants & Business Advisors Pty Ltd

*SOLE TRADERS !!!*
*SMALL BUSINESS OWNERS !!!*

ARE YOU PAYING **MORE TAX** THAN YOU SHOULD?

LET US HELP YOU
**RESTRUCTURE YOUR BUSINESS**
**REDUCE YOUR TAX BURDEN**

- ✓ TAX PLANNING & BUSINESS ADVISE
- ✓ NEW BUSINESS REGISTRATION & COMPANY/FAMILY TRUSTS SETUPS
- ✓ INSTALLATION , SETUP & TRAINING OF ACCOUNTING SOFTWARE
- ✓ BAS, IAS, PAYG PREPARATION & LODGEMENT
- ✓ ASIC & ATO LIAISON, PAYMENT PLANS & TAX AMENDMENTS
- ✓ **INDIVIDUAL TAX RETURNS - $88* PER RETURN , 14 DAYS REFUND**
- ✓ TAX RETURNS FOR PARTNERSHIPS, COMPANIES, SMSFS & TRUSTS
- ✓ ADVISE ON NEGATIVE GEARING RE: SHARES & PROPERTY
- ✓ RENTAL PROPERTY & DEPREICIATION SCHEDULES
- ✓ ADMINISTRATION & COMPLIANCE OF SELF MANAGED SUPERANNUATION FUNDS

*CALL ACHINI TODAY* TO BOOK AN INITIAL **FREE** CONSULTATION ON

**0468 747 574** OR **03 8768 8630**

WE ARE IN YOUR FRIENDLY NEIGHBORHOOD AT **23 TOBIN WAY LYNDHURST**

*EVENING & WEEKEND APPOINTMENTS AVAILABLE*

***www.atpartners.com.au***